ඔබ අප හමුවන බොහෝ කාලයක් ඔබ අප හමුවීමෙන් ඔබව වැළැක්වූයේ කුමක්ද?

ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ජිබ්රීල් තුමා දෙස බලා “ඔබ අප හමුවන බොහෝ කාලයක් ඔබ අප හමුවීමෙන් ඔබව වැළැක්වූයේ කුමක්ද?යැයි පැවසූහ. එවිට සූරා මර්යම් :64 වැනි පාඨය පහළ විය. එනම්: “නුඹගේ පරමාධිපතිගේ නියෝගයෙන් මිස අපි පහළ නොවන්නෙමු. තවද අප
ඉදිරියේ ඇති දෑද අප පසුපසින් ඇති දෑද ඒ අතර ඇති දෑද ඔහු සතුය.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ජිබ්රීල් -අලය්හිස් සලාම්- තුමා වෙත කළ පැමිණිල්ල මෙම හදීසය කතා කරයි. හේතුව ජිබ්රීල් අලය්හිස් සලාම් තුමා දින හතළිහක් ප්රමාද වී නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- වෙත පැමිණියේය. එවිට නබි තුමා එතුමා දෙස බලා: අහෝ ජිබ්රීල් “ඔබ අප හමුවීමෙන් ඔබව වැළැක්වූයේ කුමක්ද?“ යැයි විමසා සිටියහ. එනම්, ඔබ වෙත මා පැමිණිලි කරන තෙක්ම ඔබ පහළ නොවූයේ මන්ද යන්නයි. එවිට අල්ලාහ් ජිබ්රීල් තුමා වෙත “නුඹගේ පරමාධිපතිගේ නියෝගයෙන් මිස අපි පහළ නොවන්නෙමු“ යනුවෙන් එතුමාණන්ට දන්වා සිටින මෙන් දේව පණිවිඩය එව්වේය. එනම්, අල්ලාහ් මෙසේ පැවසීය: “අහෝ ජිබ්රීල් අල්ලාහ් තීන්දු කළ පරිදි ඔහුගේ අනුමැතියෙන් මිස අපි දිගු කාලයක් පහළ නොවූයෙමු. ඔහු සුවිශුද්ධය.“අප අතර ඇති දෑ ඔහු සතුය“ එනම් අප ඉදිරියේ ඇති මතුලොවෙහි කටයුතු ඔහු සතුය යන්නයි. “අප පසුපසින් ඇති දෑ) එනම් මෙලොව කටයුතු වේ. පාඨය සම්පූර් කරමින් ඒ දෙක අතර ඇති දෑ යැයි සඳහන්ව ඇත. එනම් මෙම වේලාවේ සිට අවසන් හෝරාව ඇතිවන තෙක් පවතින දෑ යන්නයි. එනම් ඒ සියල්ල පිළිබඳ දැනුම ඔහු සතුය යන්නයි. ඔබේ පරමාධිපති ඔබව අමතක කළ අයකු නොවේ. එනම් ඔබෙන් වහී ප්රමාද කිරීමෙන් ඔබව අත් හැරූ අයකු නොවේ. යන්නයි. සැබැවින්ම මෙම හදීසය යහපත් අය සමග මිතුදම් පෑම මිනිසාට අවශ්ය බවත් ඔවුන්ව මුණ ගැසිය යුතු බවත් ඔවුහු යහපත ඇති දෑහි ඔහුව හමුවිය යුතු බවත් දන්වා සිටියි.

http://sunnah.global/hadeeth/si/show/3038